**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 24 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොදු ගබඩා තොග සහ පොදු ගබඩා ප්‍රීමික්ස් ගිණුම් වල රු. 480,930 ක ශේෂය හඳුනාගෙන නිරවුල් නොකිරීමෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වත්කම් වල පැවැත්ම තහවුරු කරගෙන අදාල ගැලපීම් සිදුකළ යුතුවේ. | 2020 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී රු. 46,089 කට වෙන්දේසි කල භාණ්ඩ අයිතම 35 ක පිරිවැය වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණයකල වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කළ යුතුවේ. | භාණ්ඩ වල පිරිවැය ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව වරිපනම් බදු ශේෂය හා වරිපනම් ලේඛනය අනුව ශේෂය අතර රු. 1,218,865 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සැසඳිය යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ එකතුව රු. 588,024 ක මිශ්‍ර තැන්පත් හා කර්මාන්ත තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉතිරි වී පවතින තැන්පතු මේ වනවිට හඳුනාගනිමින් පවතින බවත්, ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 02 ක ඉන්ධන දහන පරීක්ෂාව නියමිත පරිදි සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුවේ. | එම වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව ඉදිරියේදී සිදු කරන බව දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ සිට කාර්යසාධන ගිවිසුම් සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගත යුතුවේ. | ඉදිරි වර්ෂය තුල එම කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභියාට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට ප්‍රාදේශිය සභාව සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇති බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 885,672 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 52,068,201 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2003 හා 2004 වර්ෂයන්ට අදාල බැංකුගත නොවූ මුදල්, චෙක්පත් හා ප්‍රේෂණ එකතුව රු. 526,362 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | බැංකුගත නොවූ මුදල් චෙක්පත් හා ප්‍රේෂණ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නිරවුල් කරගත යුතුවේ. | මේ වනවිට අදාළ මුදල් වලින් කොටසක් හඳුනාගෙන ඇති බවත්, ඉදිරියේදී ඉතිරි මුදල් ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | ඉකුත් වර්ෂවලට අදාල රු. 109,562 ක් වූ හරකිරීම් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | පෙර වර්ෂවල සිදු වී ඇති වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට අදාළ මුදල් වලින් කොටසක් හඳුනාගෙන ඇති බවත්, ඉදිරියේදී ඉතිරි මුදල් ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ඇ) | 1993 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුල බැංකුවට බැර වී ඇති එකතුව රු. 149,734 ක් හඳුනාගෙන මුදල් පොතෙහි අදාල ගැලපීම් සිදුකර නොතිබුණි. | පෙර වර්ෂවල සිදු වී ඇති වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට අදාළ මුදල් වලින් කොටසක් හඳුනාගෙන ඇති බවත්, ඉදිරියේදී ඉතිරි මුදල් ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,815,863 | 6,738,707 | 7,313,290 | 5,278,669 | 6,830,252 | 2,538,595 | 6,259,218 | 6,301,614 |
| කුලී | 3,588,550 | 3,512,435 | 4,619,846 | 1,382,872 | 2,586,000 | 825,945 | 2,019,230 | 1,922,358 |
| බලපත්‍ර ගාස්තු | 632,500 | 660,439 | 660,439 | 295,155 | 565,500 | 2,947,167 | 715,008 | 295,155 |
| වෙනත් ආදායම් | 20,003,000 | 25,469,990 | 35,943,302 | 26,544,649 | 14,136,800 | 42,423,381 | 15,450,862 | 22,093,951 |
| | 31,039,913 | 36,381,571 | 48,536,877 | 33,501,345 | 24,118,552 | 48,735,088 | 24,444,318 | 30,613,078 |

**2.3.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 3,674,335 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 05 ට වඩා වැඩි රු. 1,561,292 ක් පැවතුණි. | සභාවට අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | ආදායම් පරිපාලක තනතුරු 2019 වර්ෂය දක්වා පුරප්පාඩුව පැවති බවත්, ඉදිරියේ දී පවතින හිඟයන් ක්‍රමානුකූලව අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |
| **(ආ) අක්කර බදු** | | |
| 2019 දෙසැම්බර් 31 දිනට රු. 64,015 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල වසර 05 ට වඩා පැරණි ඒකක 57 කින් අයවිය යුතු රු. 53,774 ක් පැවතුණි. | සභාවට අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | අක්කර බදු අයකරන ලද පැරණි ඉඩම් වර්තමානයේදී කැබලි කර ඇති බැවින් හිඟ අක්කර බදු අය කිරීමේ ගැටළුවක් පවතින බව දන්වමි. |

**2.3.3 බලපත්‍ර ගාස්තු**

**පරිසර බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පරිසර බලපත්‍ර අළුත් නොකල කර්මාන්ත 07 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් රු. 28,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත නියමිත ක්‍රියාපටිපාටියට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | බලපත්‍ර අළුත් කරන ලෙස අදාල පාර්ශව වෙත ලිඛිතව දන්වා ඇති බවත් මේ වනවිට සමීක්ෂණයක් සිදු කරමින් පවතින බවත් දන්වමි. |

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 3,263,042 ක් හා 2019 මුල් අර්ධ වර්ෂයට අදාලව ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 7,670,120 ක් වූ අතර 2019 අවසන් අර්ධ වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු 2020 මාර්තු වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ලේඛන ලැබුණු වහාම අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් වනවිට කසළ ගාස්තු රු. 382,380 ක් අයවිය යුතුව පැවතුණි. තවද විධිමත්ව ගිවිසුම්ගත වී නොතිබීම නිසා කසළ ගාස්තු ගෙවීම දීර්ඝකාලීනව පැහැරහැර ඇති ආයතන 02 කට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | හිඟ මුදල් වාරික 03 කින් අයකර ගැනීමට මහ සභාව විසින් ගන්නා ලද තීරණ පරිදි කටයුතු කරන බව දන්වමි. |
| (ii) | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ අපදියර පිරිපහදු ඒකකය හා නොදිරන ද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගෙන සැලසුම් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුවේ. | අදාළ ප්‍රතිපාදන ලැබුණු විගස එම කටයුතු ආරම්භ කරන බව දන්වමි. |

**(ආ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා සකස් කර ඇති බව දන්වමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| (i) සභාවේ ලේකම් තනතුර 2013 ජූනි සිට පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා වැඩබැලීමේ පදනම මත නිලධාරීන් අනුයුක්ත කරමින් පැවතුණි. එමෙන්ම අනුමත ආදායම් පරීක්ෂක තනතුරක් 2017 නොවැම්බර් සිට පුරප්පාඩුව පැවතුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුවේ. | පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව හා ප්‍රධාන ලේකම් කාර්යාලය දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ii) අනුමත කාර්යය මණ්ඩලය තුල පෙර පාසැල් ගුරු තනතුරු 02 ක්, වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුරක් හා විදුලි කාර්මික තනතුරක් පුරප්පාඩුව පැවතුණි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව හා ප්‍රධාන ලේකම් කාර්යාලය දැනුවත් කර ඇති බව දන්වමි. |
| **(ආ) සේවක ණය** | | |
| වසර 10 කට වඩා වැඩි කාලයක සිට හිඟහිට ඇති නිලධාරීන් 23 දෙනෙකුට අදාල එකතුව රු. 112,651 ක් වූ හිඟ ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | ණය මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ණය මුදල් කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 05 ක් ඉවත්කිරීමට හෝ නියමානුකූල කිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නීති මාර්ගයෙන් විසඳා ගතයුතු ගැටළු සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ට්‍රැක්ටර් රථයක් අළුත්වැඩියාව සඳහා 2018 පෙබරවාරි 05 දින සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත යොමුකර තිබුණද, අළුත්වැඩියා කටයුතු කර නොතිබුණි. | නඩත්තු හා අළුත්වැඩියා කටයුතු විධිමත්ව හා නියමිත කාලවකවානුව තුල සිදුකළ යුතුවේ. | මේ පිළිබඳව අවස්ථා කිහිපයකදී අදාල ආයතනය වෙත සිහි කැඳවීම් යොමුකර ඇති බව දන්වමි. |

**3.5 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනත මඟින් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ චක්‍රලේඛයකින් ලබාදී ඇති අධිකාරී බලයකින් තොරව මහජන නියෝජිතයින් 34 දෙනෙකු වෙත එකතුව රු.1,540,000 ක ණය අත්තිකාරම් ලබාදී තිබුණි. | ප්‍රාදේශීය සභා පනත හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ මේ සඳහා ප්‍රතිපාදන සලසා දී නැත. | මහජන නියෝජිතයින් සඳහා ලබාදුන් මෙම ණය මුදල් ගරු සභාවේ හෝ මිල කමිටුවේ අනුමැතියන් ඇතුව සියයට 04 ක පොළියක් අය කිරීමට යටත්ව වාරික 10 කින් අයකර ගැනීමේ පදනම මත ලබා දී ඇති බව දන්වමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1993 වර්ෂයේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් සභාවට ලබාදී තිබූ කැබ් රථයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තරමට දිරාපත් වී තිබුණද, එහි අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළුව නිරවුල් කරගෙන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කරගෙන විධිමත්ව අපහරණය කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් උපදෙස් පතා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති අතර මෙම කැබ් රථය භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින බැවින් කුරුවිට යන්ත්‍රෝපකරණ ආයතනයට භාර දීම සම්බන්ධයෙන් ද එහි යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ උපදෙස් පතා ලිපි යොමු කර ඇති බව දන්වමි. |